## ජේ එම් ආර් කේ ජයසුන්දර එ. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය

**RTIC Appeal (ලේඛනගත කාර්යපටිපාටිය) 123/2018 (2018.04.26 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය)**

**2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවතවාගෙන යනු ලබන කාර්ය පටිපාටිය.**

**සභාපති** - මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතීඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සාමාජික** - ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සාමාජික** - විනිසුරු රෝහිනී වල්ගම
**අධ්‍යක්ෂ-ජනරාල්** - පියතිස්ස රණසිංහ

**අභියාචක** - ජේ එම් ආර් කේ ජයසුන්දර මහතා
**නොතීසිලත් පාර්ශවය** **-** ලේකම් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය

| | |
|---|---|
| **තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය:** | 2017.08.28 |
| **තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය:** | ප්‍රතිචාරයක් නොමැත |
| **නම්කළ නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය:** | 2017.10.26 |
| **නම්කළ නිලධාරියා තීරණය ලබා දුන් දිනය:** | 2017.11.07 |
| RTIC **කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය:** | 2018.01.10 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු**:

අභියාචක 2017.08.28 දිනැති ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. 2015.04.08 දිනැති ස්ථාන මාරු නියෝගයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත 2015.05.15 දින අභියාචක ඉදිරිපත් කළ අභියාචනයට කාන්ත හා ළමා කටයුතු අමාත්‍යාංශයෙන් කොමිසම වෙත යොමු කළ වාර්තාව

2. 2015.04.08 දිනැති ස්ථාන මාරු නියෝගයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත 2015.05.20 දින මානව හිමිකම් කොමිෂන් සභාවට 1710/2015 අංක යටතේ මා කළ පැමිණිල්ලට කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයෙන් කොමිසම වෙත යොමු කළ වාර්තාව
3. තනතුර හැරයාමේ නිවේදනයට එරෙහිව 2016.10.01 දිනැති අභියාචනය අනුව 2016.12.20 දින රාජ්‍යසේවා කොමිෂන් සභා කාර්යාලයෙන් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කළ ලිපියට අමාත්‍යාංශයෙන් ලබාදුන් වාර්තාව

තොරතුරු නිලධාරියා, නියමිත කාලය ඇතුළත පිළිතුරු ලබා දීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2017.10.28 න නම්කළ නිලධාරියා වෙත අභියාචනයක් ඉදිරිපත් කරන ලදී. ඉන් අනතුරුව 2017.11.07 දිනැතිව තොරතුරු නිලධාරියා අදාළ තොරතුරු සපයන ලදී. ඉන් අනතුරුව 2017.11.07 දිනැතිව තොරතුරු නිලධාරියා අදාළ තොරතුරු සපයන ලදී. අභියාචක මෙම තොරතුරු අසම්පූර්ණ බව පවසමින් 2018.01.10 දිනැතිව කොමිෂන් සභාවට අභියාචනයක් යොමු කරන ලදී. අභියාචක කරුණු දක්වමින් දන්වා සිටින්නේ වාර්තාවන්හි සඳහන් ඇමුණුම් ලබා දී නොමැති බවයි.

## අභියාචනය විභාග කිරීමේ අවස්ථාවේදී උද්ගතවූ කාරණා:

පොදු අධිකාරිය 2018.04.23 දිනැතිව කොමිෂන් සභාවේ නොතීසි වලට ප්‍රතිචාර දක්වමින් පවසා සිටියේ 2017.11.07 දිනැතිව අභියාචක වෙත ඉල්ලා ඇති තොරතුරු ලබා දුන් බවයි. තවද අභියාචනයට මෙම වාර්තාද අමුණා ඇති බව නිරීක්ෂනය විය. අභියාචක නොතීසි වලට ප්‍රතිචාර දක්වා නොතිබිණි.

## නියෝගය:

පොදු අධිකාරිය විසින් සපයා ඇති ප්‍රතිචාරය ප්‍රමාණවත් බැවින් අභියාචනය අවසන් කරනු ලැබේ.

..........................................................

**සභාපති** - මහින්ද ගම්මම්පිල

..........................................................

**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතීඥ එස්.ජී. පුංචිහේවා

..........................................................................

**කොමිෂන් සභා සාමාජික**- ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන් (Dr. Selvy Thiruchandran)

..........................................................
**කොමිෂන් සභා සාමාජික -** විනිසුරු රෝහිනී වල්ගම

*****